**2020 වර්ෂයේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත 2020/ 2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කරන සිසුන් වෙත කෙරෙන නිවේදනය**

ඉහත සඳහන් සිසුන් හට 2020/ 2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට පෙර අදාළ ප්‍රවේශ අත්පොත, මිල දී ගැනීමට හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.ugc.ac.lk මඟින් බාගත කර ගැනීමට උපදෙස් ලබා දෙනු ලැබේ.

උක්ත ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත් කිරීමේ සම්පූර්ණ අයිතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතුව පවතින බවත්, එම අත්පොත අනෙකුත් කිසිඳු වෙබ් අඩවියක හෝ වෙනත් සමාජ මාධ්‍ය ජාලයක බෙදා හැරීමට හෝ ප්‍රකාශයට පත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වෙනත් කිසිඳු තෙවන පාර්ශවයකට බලය පවරා නොමැති බවත් කරුණාවෙන් සලකන්න.

කෙසේ වෙතත්, ඉහත අත්පොත විවිධ වෙබ් අඩවිවල සහ වෙනත් සමාජ මාධ්‍ය ජාල තුළ සංසරණය වන බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර තිබේ.

ඉහත කරුණු අනුව, එවැනි වෙබ් අඩවි/ සමාජ මාධ්‍ය ජාලා හෝ වෙනත් විද්‍යුත් මාධ්‍ය වල සංසරණය වී ඇති විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ අන්තර්ගතයෙහි යම් අයුරකින් සාවද්‍ය හෝ නොමග යවන සුළු තොරතුරු අඩංගු වේ නම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එකී තොරතුරු සඳහා කිසිඳු අයුරකින් වගකීමට නොබැඳෙන හෝ වගකීමක් නොදරන බව තවදුරටත් කරුණාවෙන් දන්වා සිටිමු.

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2021.06.03